**ඌවපරණගම ප්‍රාදේශීය සභාව**

**2022.06.09 වන දින පැවති මහ සභා වාර්තාව**

**01.පිළිගැනීම**

මෙදින පෙ.ව.09.30 ට ආගම සිහි කිරිමෙන් පසු පැමිණ සිටි උපසභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලය ද ඇතුළු සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**02.පැමිණීම .**

| | |
|---|---|
| 1. කේ.ඒ.සමින්ද සුදර්ශන මැතිතුමා | ගරු සභාපති |
| 2 ආර්.ඩී.ගුණපාල මැතිතුමා | ගරු උපසභාපති |
| 3. ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 4. ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. එම්. කාංචනා රුවන්මාලි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 6. ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7.ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. නාරායනන් වරදරාජ් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09 ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. ආර්.එම් නාලිනි රාජපක්ෂ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 11. ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඩබ්.පි.සමන්ත වර්ණසූරිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. එස්.එම්.සුජීත් ප්‍රසන්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. කේ.එම්.කරුණාතිලක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. ඩී.එම්. කරුණාදාස මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. ඒ.එම්.චමින්ද ලසන්ත අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. එම්.ජී.ඒ සරත්චන්ද්‍ර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. ඒ.එම්.මංජු ප්‍රියනාත් අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. ඒ.පී.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. ඩබ්.එම්.උපාලි විරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 22.එම්.එම් සුනේත්‍රා නන්දනී මන්තිලක මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 23. කන්දසාමි පේරාම්බිගයි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 24. එම්.එම්.නිර්මලා පුෂ්ප කුමාරි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 25. ටී.බී. සුභසේන වීරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 26. එල්.එච්.ධර්මසේන මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. ඩබ්ලිව්.ජී.විජේසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 28. එස්.අඩෙකලම් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 29. ජී.දුලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 30 පුණ්‍යදාස සුගුණකුමාර් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 31. ඩී.එම්.කමල් දේශප්‍රිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 32. ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 33.ඩබ්.එම්. ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

34. ඩබ්.එම් ජයසේකර මැතිතුමා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
35. ටී.ඩබ්.ජී. උපසේන වැවේවත්ත මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම. –**

2022.05.12 දිනැති මහා සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පි.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව. 9.45ට ගරු ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන :-**

❖ රාජ්‍ය වියදම් පාලනය කිරිම- රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 3/2022 අනුව වර්තමානයේ රටෙහි පවතින ආර්ථික අර්බුදකාරි තත්ත්වයද සලකා බලා නැවත දැනුම් දෙනතුරු පළාත් පාලන ආයතන විසින් සභා අරමුදලින් සුභසාධන වියදම් දැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය සඳහා යොමු කරනු ලබන ඉල්ලීම් ලිපි නිර්දේශ කිරිම වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවා ඇති බවට පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙතින් ලිපියක් එවා ඇති බව නිවේදනය කරනවා.

❖ මැතිවරණ කොමිෂන් සභාව විසින් පළාත් පාලන ආයතන සඳහා 25% කාන්තා නියෝජනය සම්බන්ධයෙන් අප විසින් ඉදිරිපත් කල 2022.04.05 දිනැති ලිපිය ඉදිරි කටයුතු සඳහා සටහන් කරගත් බව දන්වා එවා ඇති බව මෙයින් නිවේදනය කර සිටිනවා.

පෙ.ව. 9.48ට ගරු ඩබ්.පි.සමන්ත වර්ණසූරිය මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

❖ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය වෙතින් ව්‍යාපෘති යෝජනා සකස් කිරිම පිළිබඳ පුහුණු වැඩමුළුවක් Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් කැමැත්තක් දක්වන මහජන නියෝජිතයින් ඒ සඳහා සහභාගිවන මෙන් නිවේදනය කරන ලදි.

❖ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය වෙතින් Workshop on How To Cut down Hardware Maintenance Costs -තොරතුරු තාක්ෂණ අංශය පිළිබඳ පුහුණු වැඩමුළුවක් Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් කැමැත්තක් දක්වන මහජන නියෝජිතයින් ඒ සඳහා සහභාගිවන මෙන් නිවේදනය කරන ලදි.

❖ පළාත් රාජ්‍ය සේවයේ සියලුම මාණ්ඩලික නිලධාරින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ පත්‍රය නිවැරදිව සම්පූර්ණකොට සාමදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරිපිටදි සහතික කොට, 12x10 ලිපි කවරයක බහා සීල් තබා ලිපි කවරයේ වම් කෙළවරේ "වත්කම් හා බැරකම් ප්‍රකාශය 2022" ලෙස සඳහන් කල යුතු බවත්, කවරයේ අදාල නිලධාරියාගේ නම,තනතුර හා සේවා ස්ථානය පැහැදිලිව සඳහන් කර 2022 ජුනි මස 20 වැනි දිනට පෙර සභාව වෙත භාර දෙන ලෙස නිවේදනය කරන ලදි.

❖ උළුගල කාබනික පොහොර නිෂ්පාදන කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කල බවත්, එහිදි අනාවරණය වු කරුණු සම්බන්ධයෙන් නිවේදනය කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩි.එම්.තිලකරත්න බණ්ඩා මැතිතුමා අසනිප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා අසනිප තත්ත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

පෙ.ව. 10.00ට ගරු ආර්.ඩබ්.ඩබ්..එම්.මානෙල් කුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම්,පැමිණිළි හා සන්නිවේදන ලිපි;-**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා -** අඹගස්දෝව ගැමුණු මරණාධාර සමිතිය විසින් ආදාහනාගාරයෙන් පිටවන දුම් නිසා ඒ අසල ජීවත්වන ජනතාව රෝගාබාධවලට ගොදුරුවන බවත්, දේහයන් සම්පූර්ණයෙන්ම පිළිස්සීමක් සිදු නොවන බවත් එම අප ද්‍රව්‍යයන් සතුන් විසින් තැනින් තැන දමා යන බැවින් මහත් ගැටළුවකට මුහුණු පා ඇති බව සඳහන් කරමින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලද අතර ආදාහනාගරයෙන් පිටවන දුම් සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ඉංජිනේරුවන් කැඳවා ඒ පිළිබඳව උපදෙස් ලබා ගැනීමට සහ ආදාහනයක් සිදුවන අවස්ථාවකදි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කමල් දේශප්‍රිය, එල්.එච්.ධර්මසේන මැතිතුමා සහ කාංචනා රුවන්මාලි මැතිතුමියත්,ගැමුණු මරණාධාර සමිතියේ කිහිප දෙනෙකුත් එම අවස්ථාවට සහභාගි කරවීම සුදුසු බවට තීරණය කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා -** වැලිමඩ,බෝවෙල,රන්දිය පොකුණ ලිපිනයේ පදිංචි ජේ.එම්.රංජිත් වසන්ත වීරසිංහ මහතා විසින් ඌවපරණගම ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන මැටිවලලන්ද ජල යෝජනා ක්‍රමයේ ජල පොම්පාගාරය වෙත ගමන් කරන මාර්ගය ගමන් කිරිමට නොහැකිවන අයුරින් මාර්ගයේ දෙපසම ඉනිවැටක් ගසා අවහිර කර ඇති බැවින් එම මාර්ගය ගමන් කිරිමට හැකි අයුරින් සකස් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති ලිපිය සභාගත කරන ලද කාර්මික නිලධාරින් ලවා පරීක්ෂා කර බැලීමට තීරණය කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි,ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය -** 2020 වර්ෂයේ GI බට වලට යෝජනා දාලා තිබුණා. 2021 වර්ෂයේ ජෙනරේටරයකට සමිතියෙන් මුදල් ගෙවා තියෙනවා.ඒ යෝජනා දෙක සම්බන්ධයෙන් දැන ගන්න ඕන.

ගරු සභාපතිතුමා : ජේනරේටර් සම්බන්ධයෙන් මුදල් කමිටු වාර්තාවේ සඳහන් වෙනවා. 2020 වර්ෂයේ යෝජනාව ණයහිමි කරලා තිබුණොත් පමණයි කරන්න පුළුවන් වෙන්නේ.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා**
දැනට ඉඹුල්ගස්හින්න සිට රහුපොල දක්වා දිවෙන මාර්ගයේ පයින්වත් යන්න බැහැ.අබලන් තත්ත්වයේ තියෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් දැනුවත් කලා. ඒත් කිසිම පිළිතුරක් නැහැ. කුමාරපට්ටිය ඉස්කෝලෙට යන ළමයි සීසන් එකක් අරන් වැලිමඩට ගිහින් එන්නේ.දැන් තියෙන ආර්ථික තත්ත්වයත් එක්ක ඒක ලොකු ගැටළුවක්.ඒ නිසා ඔබතුමා මැදිහත්වෙලා මේ මාර්ගය යන්න පුළුවන් තත්ත්වයට හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ඒ අනුව මාර්ගය පිළිසකර කර ගැනීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලද අතර,මේ සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කිරිමට තීරණය විය.

පෙ.ව. 10.25ට ගරු එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා** - අඹගස්දෝව සිට නවජනපදය හරහා සාප්පුකඩේ දක්වා දිවෙන මාර්ගය කාපට් ඇතිරීම සඳහා ආරම්භ කර ඇති බවත්,එය මේවන තෙක් අවසන් කර නොමැති බැවින්, දූවිලි සහිතව මාර්ගය ඇති බැවින් පාසල් ළමුන් සහ ගම්වාසීන් ඉතාමත් දුෂ්කරතාවයකට මුහුණ පෑ ඇති බැවින් එය තාවකාලිකව හෝ සකස් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති ලිපිය සභාගත කරන ලද IRoad ව්‍යාපෘතියට දන්වා යැවීමට තීරණය කරන ලදී.

පෙ.ව. 10.30ට ගරු නාරායනන් වරදරාජ් මැතිතුමා සභාවෙන් පිටව යන ලදි.

**04.යථාපරිදි කල් දී ඇති ප්‍රශ්ණ :- නැත**

**05.යථාපරිදි කල් දීඇති යෝජනා :-**

**<u>යෝජනා අංක 01 - සමිති ලියාපදිංචි කිරීම.</u>**

2019.07.22 වන දින පැවති ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශය මත ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති මෙතෙක් ලියාපදිංචි නොකළ පහත නම් සඳහන් මරණාධාර/සුභ සාධක/අනෝන්‍යාධාර හා පරෝපාකාර සමිති ලියාපදිංචි කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ. | සමිතියේ නම හා ලිපිනය |
|---|---|
| 01 | විහාර කාර්ය සාධක සමිතිය,ශ්‍රී විජයාරාම බෞද්ධ මධ්‍යස්ථානය,හත්කිඳගම,දිඹුලන |
| 02 | ගලහගම ඇඟළුම් කර්මාන්ත සංසදය,ගලහගම,හක්ගල |
| 03 | දීයාකොල ගෙවත්ත කාන්තා සහනාධාර සමිතිය,දීයාකොල,ලුණුවත්ත |
| 04 | යශෝධරා කාන්තා සුභ සාධක සමිතිය,දරගල,වැලිමඩ |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද සමිති ලියාපදිංචි කිරිමේ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 02 - බෝඹුරුඇල්ල රථවාහන ගාල් කිරීම සඳහා ගාස්තු අයකිරීම</u>**

2022.05.25 දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි බෝඹුරුඇල්ල සංචාරක කලාපයේ රථවාහන ගාල් කිරිම සඳහා පහත සඳහන් ගාස්තු අය කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| වාහන වර්ගය | අය කල යුතු මුදල රු. |
|---|---:|
| මෝටර් බයිසිකල් | 50.00 |
| ත්‍රී රෝද රථ | 100.00 |
| වෑන් රථ | 150.00 |
| බස් රථ | 200.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ආර්.එම්.නාලිනි රාජපක්ෂ මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 02 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 03 – කොන්ත්‍රාත් රියදුරු.නිමල් ප්‍රියන්ත මහතාගේ වැටුප් සහා අරමුදලින් ගෙවීම</u>**

2015.07.02 දින සිට මෙම ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන වයි.එම්.නිමල් ප්‍රියන්ත මහතාට තවදුරටත් වැටුප් ගෙවීම සඳහා වැටුප ප්‍රතිපූර්ණය කිරිමට නොහැකි බව 2022.04.04 දිනැතිව අංක CLG/UVA/12/02/06/02 දරන ලිපිය මඟින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් දන්වා එවා ඇති බැවින්, 2022.05.25 වැනි දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශය පරිදි ඔහුගේ පත්වීමේ වලංගුභාවය තහවුරු කර ගැනීමට ලිපි යොමු කර ඇති බැවින් හා මොහු දැනට කසල එකතු කිරිමේ කම්පැක්ටර් රථයේ රියදුරු වශයෙන් සේවය කරන බැවින් ද මොහුගේ සේවය අත්‍යවශ්‍ය වන බැවින් මොහු තව දුරටත් සේවයේ රඳවා ගැනීමට ඔහුගේ වැටුප සහා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,එම්.කාංචනා රුවන්මාලි මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 03 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපතිතුමා:-**

මෙතුමාගේ පත්වීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් එකෙන් තමයි දීලා තියෙන්නේ. මේ දක්වා වැඩ කලා. වැටුප් ප්‍රතිපූර්ණය වුණා. ගිය මාසයේ ලිපියක් ආවා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් වැටුප් ප්‍රතිපූර්නය කිරිමට නොහැකි බව දන්වලා. අපේ ආයතනයේ අනුමත රියදුරු තනතුරු තුනයි.ඒ තනතුරු තුනම සම්පූර්ණයි.වාහන 10ක් විතර තියෙනවා. කොමසාරිස්තුමා හරහා මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කරලා තියෙනවා. අපි ලිපියක් යැව්ව සභා අරරමුදලින් ගෙවන්න හැකියාවක් නැහැ.වැටුප් ප්‍රතිපූර්ණය කරන්න. මොහු අත්‍යවශ්‍ය සේවාවක යොදවලා ඉන්නේ.ඒ අතරතුර අපි මොහුගේ සේවය ලබා ගන්න නිසා වැටුප ගෙවන්න ඕන. ඉතිරි මාස 6 තුළ වැටුප් ගෙවීමේ දී අපි යම් අර්බුදයකට ලක් වෙනවා. අපි අයවැය තුළ මුදල් වෙන් කරලා නැහැ. වැය ශීර්ෂ මාරුවකින් තමයි ගෙවන්න වෙන්නේ. ලබන වර්ෂයේදී මෙතුමාටත් එක්ක අයවැය තුළින් මුදල් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.ඒ වෙනකොට වැටුප් ප්‍රතිපූර්ණය ලැබෙන්නත් පුළුවන්.

පෙ.ව. 10.44ට ගරු සින්නයියා අධෛකලම් මැතිතුමා සභාවෙන් පිටව යන ලදි.

**<u>හදිසි යෝජනා අංක 01 - සුසාන භූමි පිහිටි ඉඩම් ඌවපරණගම ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඌවපරණගම ප්‍රාදේශීය ලේකම්ගේ අංක DS-UP/LND.1/PVTLT/1 හා 2022.06.06 දිනැති ලිපිය හා බැදේ.ඒ අනුව පහත නම් සදහන් සුසාන භූමි ඌවපරණගම ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට, අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාව වෙත යෝජනා කරමි.

| අ.අ | සුසාන භූමියේ නම | වසම |
|---|---|---|
| 01 | දැහිවෙල සුසාන භූමිය | කොඩකුඹුර |
| 02 | ගුරු කදුරු පතන සුසාන භූමිය | වැලිඋල්ල |
| 03 | වටකඩහේන සුසාන භූමිය | හත්කිද |
| 04 | මහගස්තැන්න සුසාන භූමිය | කිරවනාගම |
| 05 | කුඩුගලහින්න සුසාන භූමිය | වැතලාව |
| 06 | නිකගොළුවාව සොහොන් පිටිය | කරගහඋල්පත |
| 07 | සොහොන් පොළගොඩ පතන සුසාන භූමිය | මූදනාව |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි, ජී. දූලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද හදිසි යෝජනා අංක 01 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක සභා වාර්තා සලකා බැලීම -**

- **මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව සලකා බැලීම:-**

2022 මැයි 25 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තා සලකා බලා එකි නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි, ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා :-**

බැකෝ යන්ත්‍රය සේවා කිරීමේ දී අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන යටනේ අපි දෙන්නේ. භාවිතා කරන ඔයිල් ඇතුළු අමතර කොටස් මත මිළ ගණන් වෙනස් වෙනවා. මේ වගේ දෙයක් අඩු මුදල මත පදනම් නොවී ඉටු කල යුතුයි. බාල ද්‍රව්‍ය භාවිතා කලොත් කෙටි කාලයයි පාවිච්චි කරන්න පුළුවන් වෙන්නේ.

**07.ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන සලකා බැලීම :-**

2022.05.01 දින සිට 2022.05.31 දින දක්වා වන මාසික ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශනය සලකා බලා අනුමත කරන ලදි.

**මිළ ගණන් විවෘත කිරීම**

## I. කසල ඇඹරුම් යන්ත්‍රය සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන |
|---|---|---|
| | | ජිනසේන පුද්ගලික සමාගම |
| 1 | MC10E Multi Chopper Couple 10HP Motor | 462,220.00 |
| 2 | MC15E Multi Chopper Couple 15HP Motor | 669,680.00 |

කසල ඇඹරුම් යන්ත්‍ර සඳහා ලැබී තිබූ මිළ ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

## II. කසල රස්කරන බක්කිය අලුත්වැඩියා කිරීම සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන |
|---|---|---|
| | | ඩිලානි මෝටර්ස්, සාප්පුකඩේ, නුගතලාව |
| 1 | ගේජ් 16 තහඩු 4’+4’ | 18,000.00 |
| 2 | වෙල්ඩින් කූරු සඳහා | 450.00 |
| 3 | වැඩ කුලිය | 15,000.00 |
| 4 | පින්තාරු කිරීම සඳහා | 7,000.00 |
| | එකතුව | 40,450.00 |

ඉහත සඳහන් සේවාව සපයා ගැනීම සඳහා සසින්ද අයන් වර්ක්ස්,පාලි මෝටර්ස් සහ ඩිලානි මෝටර්ස් වෙතින් මිළ ගණන් කැඳවීම් කලද ඩිලානි මෝටර්ස් වෙතින් පමණක් මිළ ගණන් ලැබී තිබුණි. ඒ අනුව ඩිලානි මෝටර්ස් වෙතින් සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

## III. නාම පුවරු සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | |
|---|---|---|---|
| | | සසින්ද අයන් වර්ක්ස්, අගතකුඹුර, ලුණුවත්ත | පාලි මෝටර්ස්, නහකඩිය, ලුණුවත්ත |
| 1 | අප විසින් ලබා දී ඇති සැලැස්මේ පරිදි නාම පුවරු 01ක් සාදා තීන්ත ආලේපකර ලබා දෙන ස්ටිකරය අලවා වැඩ අවසන් කර බාරදීම සඳහා මිළ | 15,600.00 | 11,000.00 |

නාම පුවරු සඳහා සුනිල් මෝටර්ස් වෙතින් මිළ ගණන් අපේක්ෂා කලද මිළ ගණන් ඉදිරිපත් කර නොතිබුණි. මිළ ගණන් ලබා දී තිබූ අනෙක් ආයතන දෙකෙන් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පාලි මෝටර්ස් වෙතින් සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

## IV. ටිකට්පත් මුද්‍රණය සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | නිල්නෙත් ආයතනය, වැලිමඩ | කලර් ප්‍රින්ට්, අඹගස්දෝව | තිවරු මල්ටිෂොප්, අඹගස්දෝව. |
| 1 | ලබා දී ඇති ආකෘතියට අනුව ටිකට්පත් 01ක් මුද්‍රණය කිරීම සඳහා | 3.10 | 2.90 | 3.00 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති කලර් ප්‍රින්ට් ආයතනයෙන් සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

V. අංක WPPF-7338 කැබ් රථය අලුත්වැඩියාව සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන |
|---|---|---|
| | | යුනයිටඩ් මෝටර්ස් පුද්ගලික සමාගම |
| 1 | ST/SHAFT Joint Assy -Replace | 5,237.10 |
| 2 | Replace Steering Column Assy | 7,070.09 |
| 3 | ADJE/Weel Aliment and CAmbBwr | 4,015.11 |
| 4 | Sundries | 4,500.00 |
| 5 | Joint Assy Steering Shaft | 52,137.56 |
| 6 | Column Asay Steering | 93,439.73 |
| 7 | Vat | 19,967.95 |
| Total | | 186,367.54 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**VI. ස්ටිකර් මුද්‍රණය සඳහා මිළ ගණන්**

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | නිල්නෙත් ආයතනය, වැලිමඩ | කලර් ප්‍රින්ට්, අඹගස්දෝව | තිවරු මල්ටිෂොප්, අඹගස්දෝව. |
| 1 | ලබා දී ඇති සැලැස්මේ පරිදි ස්ටිකර් 01ක් මුද්‍රණය කිරිම සඳහා (2'x2') | 1350.00 | 1000.00 | 1250..00 |

ඉහත මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති අඹගස්දෝව, කලර් ප්‍රින්ට් ආයතනයෙන් සේවාව ලබා ගැනීමට සභාව අනුමත කරන ලදි.

**VII. ප්‍රින්ටර් සඳහා මිළ ගණන්**

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | සොලිඩ් ටෙක්නොලජි, වානිජ මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල | ෆැෂන් ඩිජිටල් වීඩියෝ, බණ්ඩාරවෙල | PC බග් කම්පියුටර්ස්, බණ්ඩාරවෙල |
| 1 | 4 FLYDOT MATRIX ප්‍රින්ටර් 01ක් (EPSON) LQ 310 | 129,700.00 | 134,400.00 | 134,900.00 |

ඉහත මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සොලිඩ් ටෙක්නොලජි ආයතනයෙන් ද්‍රව්‍ය ලබා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**08.වෙනත් කරුණු :-**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.කරුණාදාස මැතිතුමා :-**

ගරු සභාපතිතුමනී,උඩුහාවර කොරදේකුඹුර මාර්ගයත් එලෙසමයි. I ROAD ව්‍යාපෘතිය මඟින් ඌවපරණගම ආසනයේ මාර්ග නවයක් භාර අරන් තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මේ ගැන සාකච්ඡා කල අවස්ථාවේ මේ මාර්ගවල ඉදිකිරීම් සම්බන්ධයෙන් වාර්තාවක් දෙන්න පොරොන්දු වුණා සෑම මාසයකම. මේ මාර්ග වල ගමනාගමනයට හැකිවන අයුරින් ජේසීබී යන්ත්‍රයක් යොදා වලවල් ටික වහලා මාර්ගය යථා තත්ත්වයට පත්කර දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා :-**

ඌවපරණගම හා හාලිඇල කොටස් දෙක යාවෙන හලාබ පාලමේ ඌවපරණගම පැත්තට වෙන්න තියෙන ආධාරක බැම්ම පුපුරලා තියෙනවා. ප්‍රතිසංස්කරණය නොකලොත් කඩාගෙන වැටෙන්න පුළුවන්. අනෙක වැලිමඩයි ඌවපරණගමයි යාකෙරෙන දරගල වැල් පාලමේ කේබල් එකක් කැඩිලා තියෙනවා.ඒකත් අවදානම් තත්ත්වයක තමයි තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

දරගල වැල් පාලම සම්බන්ධයෙන් මම ආණ්ඩුකාරතුමාටත් ලිපියක් යැව්වා. වැලිමඩ ප්‍රාදේශීය සභාවට තමයි ඔය පාලම අයිති. අපේ බුද්ධදාස මහත්තයා මැදිහත්වෙලා මීට අවුරුදු දෙකකට පෙර ඔය පාලම හැදුවා. අනෙක් කාරණය රතඹ,කටුගල්ල ළමයි උදේට රතඹ බුදුමැඳුර අසල විශාල ප්‍රමාණයක් ඉන්නවා. වැලිමඩ- උඩුපුස්සැල්ලාව මාර්ගය හදද්දි මම ඉල්ලීමක් කලා එම ස්ථානයට පදික මාරුවක් සටහන් කර දෙන ලෙස. ඒත් එය සිද්ධ වුණේ නැහැ. ඒ නිසා රතඹ බුදුමැඳුර අසල මංසන්ධියට (නිමල් බේකරිය අසල) පදික මාරුවක් සටහන් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.කරුණාදාස මැතිතුමා :-**

අඹගස්දෝව පොදු වැසිකිලි පද්ධතියක් තියෙනවාද?තෙල් පෝලිම්වල ඉන්න අයගෙන් දුරකතන ඇමතුම් ලැබෙනවා. එයාලා එන්නේ ප්‍රාදේශීය සභාවේ වැසිකිලි පද්ධතියට. එම වැසිකිලි පිරිසිදුභාවයෙන් තොරව තියෙනවා කියලා චෝදනා කලා. කම්කරුවන් යොදවලා සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා :-**

ඌවපරණගමට තියෙන එකම ඉන්දන පිරවුම්හල අඹගස්දෝව ඉන්දන පිරවුම්හල.වැලිමඩ පිරවුම්හල් හතක් තියෙනවා. සාමාන්‍ය ඉන්දන පිරවුම්හල්වලට ඉන්දන ලැබෙන ආකාරයටමයි මෙහෙටත් ලැබෙන්නේ. ඌවපරණගම එක් ඉන්දනහලක් පමණක් ඇති බැවින්,වැඩිපුර ප්‍රමණයක් භාවිතා කරන බැවින් ක්‍රමවත්ව දවස් තුනකට සැරයක් ක්‍රමවත්ව,කාර්යක්ෂමව ඉන්දන ලබා ගැනීමට බනිජ තෙල් අමාත්‍යවරයා දැනුවත් කරලා ක්‍රියා මාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

අපේ ගමේ පාලම හැදුවා. පාලමෙන් උඩගමට යන මාර්ගය අධික බෑවුමක්. මේ මාර්ගයේ මීටර් 100 ක ප්‍රමාණය වැස්ස ආවාම පස් ටික සෝදාගෙන ගඟට යනවා. විශාල පාරිසරික හානියක් වෙනවා. මේ සම්බන්ධයෙන් පිළිමයක් යොදන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර රාජපක්ෂ මැතිතුමා :-**

ඌවපරණගම ආසනයේ එක සෙඩ් එකක් තිබිලා අත්‍යාවශ්‍ය සේවාවන්වලට කිසිම අවස්ථාවක ඉන්දන ලැබෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් ඛනිජ තෙල් සංස්ථාවට ලිපියක් යවලා කොටගලටත් ලිපියක් යවලා අත්‍යාවශ්‍ය සේවාවන්වලට අවශ්‍ය ඉන්ධන ලබා දෙන්න කියන ඉල්ලීම කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි, ආර්.එම්.නාලිනි රාජපක්ෂ මැතිතුමිය:-**

ගරු සභාපතිතුමනී, තුප්පිටිය විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. හැකි ඉක්මනින් එහි ඇස්තමේන්තු සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

පෙ.ව. 10.56ට ගරු සෝමා එදිරිසිංහ මැතිතුමිය සහ සුනේත්‍රා නන්දනී මැතිතුමිය සභාවෙන් පිටව යන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.එම්.ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා:-**

ගරු සභාපතිතුමනී,මීට පෙර සභා වාරයේදී මා ඉදිරිපත් කලා මැදවෙල සහ කරගහඋල්පත ග්‍රාම සේවා වසම්වල ගවයින් නිදැල්ලේ යෑම පිළිබඳව දැනුවත් කිරීමක් කිරිමට අවශ්‍ය බව. ලේකම්තුමා ඒ සඳහා දිනයක් ලබා දෙන ලෙස මට දැන්වූවා. මම දිනයක් යොදාගෙන සභාවට දන්වලා උදේ වෙලාවේ ගමේ මිනිස්සු ඔක්කෝම කුඹුරුවල සිටින බැවින් මෙය කිරිම සුදුසු නොවන බැවින් සවස් කාලයේ වාහනය ලබා දෙන ලෙස ඉල්ලීම් කලා.ඒ වෙලාවේ ප්‍රශ්නයක් ආවා සභාවේ රියදුරෝ නැහැ කියලා. ඒ නිසා කලින් යොදා ගන්න කියලා. මම සියල්ලම ලෑස්ති කරගෙන කතා කරනකොට කියනවා ශබ්ද විකාශන යන්ත්‍රයක් නැහැ.ඔබතුමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් ඉල්ල ගන්න කියලා. සභාවට ශබ්ද විකාශන යන්ත්‍රයක් නැහැ කියලා දන්නෙත් ඒ වෙලාවේ. අපි ලිපියක් ඉදිරිපත් කලාම අදාල කටයුතු සොයා බලා සිදු කරන්න ඕන මම නෙවෙයිනේ. මට පුළුවන් මගේ වාහනයේ ශබ්ද විකාශන යන්ත්‍රයක් සවිකරගෙන ගම වටේ ගිහින් දැනුවත් කිරිමක් කරන්න. ඒක නීත්‍යානුකූල නොවන නිසා ඔබතුමාට පුළුවන් නම් වෙනත් දවසක මෙය සිදු කර දෙන්න.

ඒවගේම තමයි මේ දවස්වල තෙල් ප්‍රශ්නයත් සමඟ පාසල් ළමුන් ප්‍රවාහනයේ දී ලොකු අඩු පාඩුවක් සිදුවෙනවා මැදවෙල සිට වැලිමඩ සිසු සැරියේ ප්‍රවාහන සේවයෙන්. මැදවෙලින් බස් රථයක් තියෙන්නේ පෙ.ව.6.40ට.එයින් මැදවෙල විද්‍යාලය,ජනාධිපති විද්‍යාලයේ ළමයින් බස්සවා වැලිමඩට යනකොට පෙ.ව.7.30 පහු වෙනවා. පාසල් ඇරුණු පසු බස් රථය මැදි විදුහලේ සිට මැදවෙලට එනකොට ප.ව.1.30ට බෙල් එක ගහනකොට 1.35ට බස් එක ඇවිත් ළමයින්ට බස් රථයට එන්න වෙන්නේ නැහැ. ඒ ගැන දැනුවත් කිරිමක් කලා නම් හොඳයි.මේ මාසයේ සීසන් සඳහා වැඩි ඉල්ලුමක් තියෙනවා. පාසල් ළමුන් ප්‍රවාහනයේදී වැඩි අවධානයක් යොමු කර පෞද්ගලික සේවයට ඉඩ නොදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සලසන්න ක්‍රමවේදයක් හදන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කරුණාදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනී, ගොවියන් දැන් වී වගාව අවසන් කරලා ඉතාමත් ඛේදනීය තත්ත්වයකට පත්වෙලා ඉන්නේ. ගොයම් ටික මඩවගන්න කෙටි ක්‍රමවේදයක් නැති හේතුවෙන් අත්‍යාවශ්‍ය ඩීසල්,භූමිතෙල්,පෙට්‍රල් ලබා ගන්න ගියාම ගොවියා ගොවි සංවිධානයේ නිලධාරිගෙන් ලිපියක් ලබාගෙන ඒ ලිපිය වසමේ සංවර්ධන නිලධාරිගෙන් අත්සන් කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා අරන් ගිහින් අත්සන් කරගෙ වැලිමඩ පෝලිමට යනකොට තෙල් ඉවරයි.රස්තියාදු වීමක් විතරයි සිදු වෙන්නේ. අනෙක් කාරණය මේ කන්නයේ අර්තාපල් වගා

කරන්න පොහොර නැහැ. පොහොර මිටියක් රු.25000.00ක් වෙනවා. රු.25000.00ක් දීලා වී පැලක අල හදන්න පොහොර මිටි තුනක්වත් යනවා. එතකොට රු.75000.00ක් විතර වියදම් වෙනවා. මේ ප්‍රශ්නය නිසා ගොවියා බීජ අල විකුණනවා මොට් කඩලා කෑමවලටත්. ඔබතුමා බදුල්ලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමට යන වෙලාවට ඌවපරණගම,වැලිමඩ ගොවියා පත්වෙලා ඉන්න තත්ත්වය දැනුවත් කරන්න කියලා. ඉන්දියාවෙන් යූරියා/ MOP/ TSPපොහොර ඇනවුම් කරනකොට වී වගාව ගැන කියනවා ජන මාධ්‍යයෙන්.එහෙත් මේ ඌවපරණගම, වැලිමඩ, නුවරඑළිය ප්‍රදේශවල ගොවීන්ට පොහොර දෙන එක ගැන ජන මාධ්‍යයෙන් ප්‍රකාශ කරන්නේ නැහැ.කියන්නේ එළවළු මිළ වැඩියි කියලා විතරයි. මේ කන්ද උඩරට කුඹුරු ටිකටවත් ඉන්දියවෙන් ගේන පොහොර ගොවිජන සේවා එක හරහා හරි එක් වෙළඳසැලක් නම් කරලා හරි ලබා ගන්න අවශ්‍ය කටයුතු කර දෙන්න කියන ඉල්ලීම කරමු.

පෙ.ව. 11.07ට ගරු ඩබ්.ජී.විජේසිංහ මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති, ආර්.ඩී.ගුණපාල මැතිතුමා:-**

ගවයින් නිදැල්ලේ හැසිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරිම් කරනකොට ඌමාඇල සිට පේරවැල්ල දක්වාත් දැනුවත් කරන්න. අනෙක් කාරණය සභා ලේකම්තුමා ස්ථාන මාරුවක් සඳහා පිටත් වෙනවා. එතුමා හිටපු කාලය තුළ ඉතාමත් වටිනා සේවාවක් ඉෂ්ට වෙලා තියෙනවා. තෙල්හවඩිගම වසමේ කුකුලැල්බොක්ක අනාරක්ෂිත මාර්ගය ගමන් කිරිමට හැකිවන ආකාරයට කඩිනමින් සකස් කර දී තියෙනවා. මහජනතාවගේ අවශ්‍යතාවයන් ගැන ප්‍රාදේශීය සභාවක් විදිහට සිදු කල යුතු කාර්යභාරය කෙරෙහි තමන්ගේ අවධානය යොමු කොට ඉතාමත් ක්‍රියාකාරීව කටයුතු කිරිම සම්බන්ධයෙන් මම මගේ ගෞරවනීය ස්තූතිය පිරිනමනවා. ඒවගේම නව සභා ලේකම්තුමියටත් මෙහි සේවය කරන කාලය තුළ ඒ හා සමාන සේවයක් අප ප්‍රදේශයට ඉටු කිරිමට හැකිවේවායි පතනවා.

හාඟිලිඇල්ල මාර්ගය ගැන සම්බන්ධයෙන් කතා කලොත් 2010 වර්ෂයේ දී මම තමයි පාර කපන්න ආරම්භ කලේ. බදුල්ල පාර ජේනවා. නමුත් එම මාර්ගයට යන්න කිමී.20ක් පමණ යන්න ඕන. ඒ නිසා මෙම මාර්ගය ඉතාම වැදගත්. එම නිසා කාරුණික අවධානය යොමු කරලා මාර්ගයේ ඉතිරි වැඩ සම්පූර්ණ කර දෙන්න කියන ඉල්ලීම කරනවා. ඒවගේම ගලහගම ඇඟළුම් කර්මාන්ත ශාලාව ඉදිකිරිම සම්බන්ධයෙන් අවශ්‍ය ඉඩම නිදහස් කර ගැනීමේ කටයුතු වෙනුවෙන් සභාව හරහා සිදුවිය යුතු වැඩ කොටස් සිදුවීමෙන් දැන් ඉඩම නිදහස් කර ගැනීමේ සිද්ධ වෙලා තියෙනවා.ඒ පිළිබඳවත් මගේ ගෞරවනීය ස්තූතිය පිරිනමමින් සියලු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා:-**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. ඌවපරණගමත් තෙල් ප්‍රශ්නය නිසා ගැටළු තියෙනවා. මමත් සිසු සැරිය බස් රථයක් ධාවනය කරනවා. ගිය මාසයේ දවස් 18ක් බස් රථය ධාවනය කලේ නැහැ. අපට ප්‍රමුඛතාවයක් දෙන්න ඕන. ඩිපෝවත් එක්ක කතා කරලා පෞද්ගලික බස් රථවලටත් තෙල් ටික ලබා ගන්න අවශ්‍ය කටයුතු කර දෙන්න. ඩිපෝවත් එකඟයි මේ කාරණයට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා:-**

සියලු දෙනාගෙන්ම අවසරයි.ඔබතුමි මුලින්ම දැනුම් දුන්නා සභාවට නව ලේකම්වරියක්පත්වෙලා එන බවත්,හිටපු ලේකම්තුමා වැලිමඩ සභාවට ස්ථාන මාරු යන බවත්,නවක නිලධාරියෙක් සහ නිලධාරිනියක් සභා කටයුතු සඳහා එකතුවූ බව.ඒ සියලු දෙනාට මහජනතාවට වඩා ඵලදායි සේවාවක් ඉටු කිරීමට සුභ පැතුම් පිරිනමනවා. දැනට රටේ තියෙන ආර්ථික ප්‍රශ්නයට පිළියමක් ලෙස වැරදි ආර්ථික ප්‍රතිවිපාකයන් භුක්ති විඳින වෙලාවක අවසාන මොහේත්තේදීවත් මේ තියෙන සම්පත් ටික කළමනාකරණය කර ගත යුතුයි. කොල පාගන මැෂින් සඳහා ගොවියාට තෙල් ටිකක් ගන්න විදිහක් නෑ. වී වගා කරන ප්‍රදේශවල මෙය ක්‍රමවත්ව සිදු කලේ නැත්නම් හාල් මිළ ඉහල යනවා.පොහොර ලබාදීම සම්බන්ධයෙනුත් ගැටළු තියෙනවා. පොහොර තහනම ඉවත් කලත් ගොවියාට පොහොර ලැබෙන්නේ නැහැ. මේ තත්ත්වයන් කුමන හෝ ආකාරයට විසඳා ගත යුතුයි. අපේ රටේ තියෙන්නේ ඩොලර් නැති ප්‍රශ්නයක්.තාමත් තේ දළු අදින ලොරි ටිකත් තෙල් පෝලිමේ.ඉන්දන අර්බුදය නිසා ප්‍රවාහනය බිඳ වැටුණමත් ඒ පාඩුව එන්නේ ගොවියාට. දේශපාලන මත ගැටුම් තියෙනවා.නමුත් මේ තත්ත්වය මහජන නියෝජිතයෝ විදිහටතේරුම් අරගෙන එකතුවෙලා මේකට උත්තරයක් හොයමු.සියලු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි, එම්.කාංචනා රුවන්මාලි මැතිතුමිය:-**

ගරු සභාපතිතුමනී,පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුනි,මන්ත්‍රීවරියන්,සභා ලේකම්තුමා ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගෙන්ම අවසරයි. අපිම විරුද්ධ වුණ එක් අවස්ථාවක අඹගස්දෝව නව නගරයේ පදික මාර්ගය අසල වෙළඳාම් කරන වෙළෙන්දන් ඉවත් කරන්න සභාවට ආදායම් දෙන කඩවල්වල ආදායම අඩුවන නිසා. නමුත් වර්තමාන තත්ත්වය මත වෙළෙන්දන් ඇවිත් ඉල්ලීම් කරනවා නැවත එලවළු හා පළතුරු වෙළඳාම් කරන්න.රට යථා තත්ත්වයට පත්වෙනතුරු ඒ අයට අවස්ථාවක් ලබා දෙන්න පුළුවන් නම් ලබා දෙමු කියලා ඉල්ලා සිටිනවා.

ඒවගේම සභා ලේකම්තුමා ඇවිත් තුන්වැනි සභාවට සහභාගි වුණේ. වැඩකටයුතු සාර්ථකව කරගෙන ගියා කියන එක කාර්ය මණ්ඩලය තුළින්ම අපට අහන්න ලැබුණා. ඒ නිසා මම ඔබතුමාට කොහේ ගියත් ඒ රාජකාරි අකුරට කරන්නට ධෛර්යය හා ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම නව සභා ලේකම්තුමියට අපේ ප්‍රදේශයේම කෙනෙක් වෙන්න ඇති කියලා හිතෙනවා. එතුමියටත් අපේ බල ප්‍රදේශයේ අපිත් එක්ක එකතුවෙලා මේ වැඩ කටයුතු කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා:-**

සභාව සතුව පොලවල් තුනක් තියෙනවා.ඒවා අභාවයට යනවා දැන්.අදියාරවත්ත පොලේ ස්ථිරවම වෙළෙන්දන් 150ක් විතර හිටියා.දැන් විසිපහක්වත් එන්නේ නැහැ.හේතුව තමයි ඩීසල් ප්‍රශ්නය. යාලගමුව,මඩුල්ල වැනි ප්‍රදේශවලින් ගොඩක් වෙළෙන්දන් ආවා.දැන් එන්නේනැහැ. ගොවීන් එළවළු පොලට ගේන්නේ නැහැ.කැප්පෙටිපොල අරන් යනවා. ඒ නිසා පොලේ ටෙන්ඩර්කරුත් බොහොම අපහසුතාවයට පත්වෙලා ඉන්නේ. හැකියාවක් තියෙනවා නම් ඉදිරියේද ☺ බදු අය නොකර ඉන්න. සභාවට අරන් කරනවානම් හොඳයි කියන එක මගේ අදහස. අනෙක් කාරණය අඩු ආදායම්ලාභීනට බඩු මල්ලක් බෙදුවා.ඒත් ඒවා ලැබිය යුතු පුද්ගලයින්ට ලැබුණේ නැහැ. රත්නෝදාගම ජල යෝජනා ක්‍රමයට යොදවලා ඉන්න පුද්ගලයාත් හරියට වැඩ කටයුතු කරන්නේ නැහැ. දවස් දහය,පහලොවක් වතුර බෙදලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඒ.එම්.චමින්ද ලසන්ත මැතිතුමා:-**

ගරු සභාපතිතුමනී, අපට ආහාර ප්‍රශ්නයක් තියෙනවා. අපේ රට බංකොලොත් වෙන්න පළමු හේතුව තමයි පොහොර නැතිකම. ඒ නිසා ගොවිතැන් කරන්න බැහැ.වී වගාව කරන්න බැහැ. අද උදේ අපේ ගම්වල කඩවල හාල් නැහැ. ඒ නිසා අපට කොහොමහරි පොහොර ටිකක් ලබා ගන්න කටයුතු කරන්න ඕන. ගිය අවුරුද්දේ රු.1500.00ට ගොවිජන සේවා එක හරහා පොහොර ලබා දුන්නා.ඒ කන්නයේ අර්තාපල් වගාවත් සිද්ධ වුණා. අද කුඹුරුවල අල හොන්ඩරයක් හදා ගන්න බැහැ.කැරට් දාන්න තමයි ගොවීන් බිම් සකස් කරන්නේ. අද ඒ බීජවලත් මිළ වැඩිවෙලා තියෙන්නේ. මහා පරාක්‍රමබාහු රජතුමා ඉන්නකොට පොලොන්නරුවේ අපේ සහල් ටික පිට රට යැව්වා. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පහල මට්ටමේ සිට ඉහල මට්ටමේ 225 දක්වාම දැනුවත් කරන්න ඕන.

**ගරු සභාපතිතුමා :-**

සියලු දෙනාගෙන්ම අවසරයි. අද දවසේ සභාවේ කටයුතු.න්‍යායපත්‍රානුකූලව කටයුතු කරගෙන යාම සඳහා මට සහය දක්වපු ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට මම ස්තූතිවන්ත වෙනවා. ඒවගේම මතුවුණ කාරණා කිහිපයක් සම්බන්ධයෙන් මම අදහස් ප්‍රකාශ කරන්නම්.

රටේ තියෙන ඉන්දන අර්බුදය සම්බන්ධයෙන් තමන්ට ගෝචර වුන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් කතා කලා. මෙය සමස්ත ආර්ථික ක්‍රියාවලියම අඩපණ කරලා තියෙනවා. පාසල් වාහන,මගී බස්රථ,වෙළඳ ව්‍යාපාර වෙන්න පුළුවන්. ඒවා අපි සියළු දෙනාම අත්විඳිමින් ඉන්නවා. අපි යම් මැදිහත්වීමක් කරන්න උත්සාහ කරමු. අපි යම් යාන්ත්‍රණයක් සාදා ගත යුතුයි කියන තැන මමත් ඉන්නවා. මොකද දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වෙන්න දෙන්න බැහැ. ඒගොල්ලෝ මේ රටේ අනාගත ආයෝජනය. මේ ආසනයේ තියෙන්නේ එක් ඉන්දනහලක් පමණක් බැවින් අපි ගරු ඇමතිතුමාටත්, කොටගල තෙල් බෙදා හැරීමේ මධ්‍යස්ථානයත් දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා විධිමත් ක්‍රමවේදයකට පාසල් බස්රථ සහ අනෙකුත් ක්‍රියාවලිය කඩිනම්වන කණ්ඩායමට ලබා දෙන්න කියන ඉල්ලීම කරලා.මෙම අභාග්‍යසම්පන්න අවස්ථාවේ අවසානය කොතනද කියලා ඔබට මට ජේනතෙක් මානයක නැහැ. දැනට විසඳුමක් සොයා ගත නොහැකි බවයි පෙනී යන්නේ.

පදික වෙළඳාම සම්බන්ධව අපි විරුද්ධ වුණේ මේ ප්‍රාදේශීය සභාවටත් ගොවිජන සේවා එකටත් යන තැන වාහන එහාට මෙහාට හරවන්න බැරි විදිහට බෝධීන වහන්සේ යටකරපු වෙළඳාම.අපි මේ තියෙන තත්ත්වයත් එක්ක රථවාහන අර්බුදයට හා පදිකයින්ට ගමන් කිරිමට හැකිවන ආකාරයට මාර්ග අවහිරයකින් තොරව නීත්‍යානුකූල තත්ත්වය මත පදනම්ව බලපත්‍රයක් ලබාගෙන වෙළඳාම් කිරීමට අවස්ථාව ලබා දෙමු. මාර්ග අවහිරවීමකින් යම් අනතුරක් සිදුවුවහොත් එහි වැරැද්ද එන්නෙත් සභාවටනේ.

නිකගොල්ල පොල අද නැත්තටම නැතිවෙලා තියෙන්නේ. ලුණුවත්ත පොල බොහොම අඩපණ විදිහට යන්නේ. අදියාරවත්තේ නම් සිද්ධ වුණේ ලොකු තරඟකාරීත්වයකින් ටෙන්ඩර්කරුවා ඉහල මිළක් යටතේ ලබා ගත්තා. ඔහු දැන් අමාරුවේ වැටිලා ඉන්නේ. ඒ නිසා ඒක නැවත ටෙන්ඩර් කරමු. නැතහොත් මස්පන්න උප කාර්යාලයේ සේවකයෙක් අදියාරවත්ත පොලට අනුයුක්ත කරලා ඉදිරි මාස 6 තුළ බදු කුලී අය කර ගන්න කටයුතු කරමුයි කියලා මගේ අදහස. ටෙන්ඩර්කරුට ගෙවාගෙන යන්න බැරිවෙයි. එයාව දැනුවත් කරලා ලිඛිතව දෙන්න කියන්න. බදු සහන ලබා දෙන්න බැහැ. මෙය තරඟකර ලබා ගත් ටෙන්ඩරයක් නිසා අනෙක් ටෙන්ඩර්කරුවන් නීතිමය තත්ත්වයකට වුවත් යන්න පුළුවන්.

ජල බෙදුම්කරුවන්ගේ ප්‍රශ්නය අපට තියෙනවා. රත්නෝදාගම ජල යෝජනා ක්‍රමය ප්‍රජා ජල ව්‍යාපෘතිය හරහා දැන් කරගෙන යනවා. මේ රටේම තියෙන ප්‍රශ්නය ඒකටත් බලපාලා තියෙනවා.නිවැරදිව ජල යෝජනා ක්‍රමය භාර දුන් පසු ජල බෙදුම්කරුවන්ගේ ප්‍රශ්නය ඉතාමත් කඩිනමින් විසඳන්න බලාපොරොත්තු වෙනවා.

මීට මාස තුනකට ඉහතදී අපේ සභා ලේකම්තුමා පුබුදු බණ්ඩාර මහත්තයා ඉතාමත්ම හොඳ අනර්ඝ සහයෝගයක් මට ලබා දුන්නා. විශේෂයෙන්ම එතුමා තරුණයෙක්. එතුමාටත් තිබුණා අපට තියෙන සිතුම් පැතුම්. මේ රටට සේවය කරන්න.ඒවගේම දක්ෂයෙක්.කළමනාකරණ සේවයේ ඉඳලා විභාගයට මුහුණ දීලා විභාගයෙන් ජය අරගෙන ඇවිත් තිබුණා. සමහර සභාවල ලේකම්වරුන්ට වැඩ භාර දෙන්න කැමැත්තක් තිබුණේ නැහැ සභාපතිවරුන් වැඩබලන සභා ලේකම්වරු හිටපු ස්ථානවල.මට කතා කරපු පළමු අවස්ථාවේම මම කීවා මට උදව් කරපු ලේකම්වරයෙක් වැඩ ලනවා. මම බලලා ඔබතුමාට කියන්නම් කියලා අපි එතුමාට අවස්ථාව ලබා දුන්නා. සුදුසුකම්වලට පත්වුණ නිලධාරින් ඉන්නවානම් කොපමණ අපිත් එක්ක හිතෛෂී වුණත්,ඥාති සම්බන්ධතා,දේශපාලන සම්බන්ධති තිබුණත් සුදුස්සන්ට සුදුසු තැන දෙන්න ඕන රාජ්‍ය සේවයේ.ඒ නිසා පුබුදු මහතාට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරේ වැඩ භාරගන්න කිසිම බාධාවකින් තොරව මා සහ ඔබ වගේම කාර්ය මණ්ඩලයත් ඉතාමත්ම අනගි සහයෝගයක් ලබා දුන්නා. එතුමාට ඊට පසුව අපේ ප්‍රාදේශීය සභාවේ දින 3ක් හා වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දින 2ක් සේවය කරන්න කියලා දන්වලා තිබුණා. මම ඒ යෝජනාවට විරුද්ධ වුණා. එතකොට මේ ආයතන දෙකම කඩා වැටෙනවා. සභාපතිවරයා විදිහට මම දින පහේම සභාවේ රැදෙන්නේ නැහැ. ඊට පසුව පරිපාලන විධායකයා විදිහට සභා ලේකම්වරයා රැඳී සිටින්න ඕන එන පුරවැසියන් හා කාර්ය මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කරන්න.මෙතුමාට මම කීවා ඔබතුමා කැමති තීරණයක් ගන්න කියලා. මම තව මාස අටක් ඉඳලා යනවා. ඔබතුමාගේ රැකියා ජීවිතය තව විශාල දුරකට යන්න ඕන. මෙතුමා නිකපොත තමයි පදිංචිය.දැනට දියතලාවේ කුලී පදනම මත ඉන්නවා. ඒ නිසා එතුමාට පහසු ස්ථානයක් ලැබෙනවා නම් වඩා වැදගත් කියන තැන තමයි මම හිටියේ.

ඒ අනුව මගෙන් ඉල්ලීමක් කරලා තිබුණා අලුත් සභා ලේකම් තනතුරු දෙනකොට අපේ බිසෝමැණිකේ මහත්මිය. මෙතුමියත් ඌවපරණගම ජන්මලාභය ලබා දැනට දඹවින්නේ පදිංචි වෙලා ඉන්නේ. මම කොමසාරිස්තුමාට එක දෙයක් කීවා කවුරු එච්චත් කමක් නැහැ හැබැයි මම පොරොන්දුවක් වෙලා තියෙනවා පුබුදු මහත්තයා කවදාහරි බුත්තලට යනකොට එතුමියව මේ සභාවට ගන්නවා කියලා. ඒ නිසා ඒ පොරොන්දුව ඉෂ්ඨ කල යුතුයි කියලා මම බලාපොරොත්තු වෙනවා. කොයි සභා ලේකම්වරයෙක්වත් ගේන්නවත් ගෙනියන්නවත් මම මැදිහත් වුණේ නැහැ. මම මේ සභාවට ආවාට පස්සේ සභා ලේකම්වරු පහක්,අගමැතිවරු දෙදෙනෙක්,ආණ්ඩු කිහිපයක් යටතේ වැඩ කරලා තියෙනවා. ඒක තමයි දේශපාලනයේ ස්වභාවය. අපි තිස්හත් දෙනා හරියට වැඩ කරනවා නම් ඒක අපට ප්‍රශ්නයක් නෙවෙයි කියන එක මගේ පෞද්ගලික අදහස.මම අපේ මන්ත්‍රී මණ්ඩලයේ සියලුම දෙනාගේ සුභ පැතුම් එක්කරනවා හිටපු පුබුදු ලේකම් මහතාට ඔබතුමාගේ රාජකාරි ජීවිතය ඉතාමත්ම සාර්ථක වෙන්න කියලා.

ඒවගේම සභා ලේකම්තුමියටත් දීර්ඝ පරිනත රාජකාරි ජීවිතයක් තියෙනවා. පළාත්පාලන ආයතන සම්බන්ධයෙන් බණ්ඩාරවෙල මහ නගර සභාව,වැලිමඩ ප්‍රාදේශීය සභාව,කලාප අධ්‍යාපන කාර්යාලය වැනි ස්ථානවල සේවය කරලා තියෙනවා.ඌවපරණගම ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න අපේ සුභ පැතුම් පිරිනමමින් ගරු මන්ත්‍රීතුමන්ලාට,තුමියන්ලාට අද දවසේ න්‍යාය පත්‍රයට අනුව කටයුතු පවත්වාගෙන යාම සඳහා මට දැක්වූ දායකත්වය,සහයෝගය වෙනදා වගේම එක් කිරිම පිළිබඳව මගේ ගෞරවනීය ස්තූතිය පුද කරමින් සභාවේ කටයුතු මෙයින් අවසන් කරනවා.

ඒ අනුව පෙ.ව.11.45 ට ගරු සභාපතිතුමා විසින් සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ස්තූතියි.
මෙයට
විශ්වාසී,

සමින්ද සුදර්ශන කුරුප්පුආරච්චි,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව ,

මෙම සභා වාර්තාව ...................... වන දින පැවති මහ සභාවේදී ...................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ යෝජනාවෙන් ..................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/සංශෝධනයට යටත්ව සභා සම්මත විය.